# <u>රබර් වගාවට වෙන්නේ මොකක්ද?</u>

**<u>(මෙම ලිපිය 2020 සැප්තැම්බර් මස 29 වන අගහරුවදා දින දිනමිණ පත්‍රයේ පල විය.)</u>**


ආචාර්ය ප්‍රියානි සෙනෙවිරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා)
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත
e-mail-ddrbiorrisl@gmail.com




බ්‍රසීලය නිජ බිම වූ 1876 වසරේදී ශ්‍රී ලංකාවට පැමිණි මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයට දැවැන්ත ශක්තියක් සපයන රබර් ශාකය ලංකාවට පැමිණ වසර 144ක් සපිරෙන මෙමවසර කවුරුන් හෝ නොසිතූ විරූ ලෙසට තීරණාත්මක වසරක් විය.

රබර් වගාව මුහුණ දුන් පළමු වසංගත තත්වය මෙය නොවන බව ඉතිහාසය අපට පවසයි. අනුරාධපුර වැව් බැඳි රාජ්‍යයේ ඒ ආශ්‍රිතව මුල්ම රබර් වගාවන් පැවතුන අතර, වැව් අශ්‍රිතව ජීවත් වූ ජනතාවට මැලේරියා වසංගත තත්වය ජය ගත නොහැකිවූ නිසා එම ප්‍රදේශද, අනෙකුත් සියලු වගා හා රබර් වගාවන්ද අත්හැර දැමීමට වසංගතයෙන් බේරුන අතලොස්සට සිදු විය. ඉතිහායයේ දැක්වෙන පරිදි ඒ වසර 100කට වඩා ඉහතදීයි. නමුත් අද තත්වය ඉඳුරාම වෙනස්ය. මුළු ලෝකයම විශ්ව ගම්මානයකි.කොවිඩ් වසංගතයෙන් බේරී යාමට තැනක් නැත. බේරී යායුතුද නොවේ. ලංකාව තුලත් ලෝකය තුලත්(ඇඳිරි නීතිය හා තාවකාලිකව වසා දැමුන තත්වයන් හමුවේ) රැකියාව කරගත නොහැකි තත්වයක් උදාවී සිටි පිරිස්

බොහෝය. එමෙන්ම ආර්ථිකය කඩා වැටුන තත්‍වය යටතේ වැසීගිය ව්‍යාපාර හා කර්මාන්ත ඊටත් වැඩිය. එහෙත් ස්වභාව ධර්මය ජයගත් බවක්ද ඒ අතර කියැවේ. එහි සත්‍යතාවයන් ද පෙනේ. එමෙන්ම ස්වභාව ධර්මයට යාදීගෙන ඒ හා බැඳි පැවතුන වගාවන් කර්මාන්තද ජයගත් බව හා තව දුරටත් ජයගන්නා බවක්ද පෙනේ. මෙය ගෝලීයවද සත්‍යයකි. ලංකාව ගැන විශේෂයෙන් සලකා බලන කල කොවිඩ් 19 තත්‍වය නිසා, රබර් වගාවේ කිරි කැපීම නවතා දැමුනේ මාර්තු 19 නුදුරු දිනයන්හිය. එහෙත් ඒ වන විට බොහෝ කුඩා රබර් ඉඩම් හිමියන් “කොළ නිවාඩුවට” ඉඩදී කිරි කැපීම නවතා තිබුණි. කොළ නිවාඩුව හෙවත් රබර් ගස්වල වාර්ෂිකව සිදුවන පත්‍ර පතනය ශ්‍රී ලංකාවේ සිදුවන්නේ පෙබරවාරි - මාර්තු - අප්‍රේල් මාස වලදීය. එය කාලගුණය හා දේශගුණය අනුව වෙනස් කම් පෙන්වයි. එනම් 2018 වසරේ පෙබරවාරි මාසයේ කොළ හැලී නැවත හොඳින් දළු මේරීමට මාස තුනක් ගතවිය. එහෙත් 2019 වසරේ පැවති අධික වියළි කාලගුණික තත්‍ව යටතේ පෙබරවාරි මාසයේ කොළ හැලීම සම්පූර්ණ වූ අතර, මාර්තු අවසාන වන විට දළු මෝරා අප්‍රේල් මුල සිට කිරි කැපිය හැකි විය.මෙම වසරේද අප්‍රේල් වන විට ඉතාමත් හොඳින් දළු මෝරා සරු සාර වියනක් වර්ධනය විය.සාමාන්‍යයෙන් දිගටම කිරි කපන කුඩා ඉඩම් හිමියන් සතු වගාවන් වල පවා මේ වසරේ කොවිඩ් 19 හේතුවෙන් සති 2 සිට 4 දක්වා කාලයක් කිරි කැපීම නවතා තිබුණි.

අප සියලු දෙනාම දන්නා පරිදි අප්‍රේල් මස මැදදී යෙදෙන සිංහල හා හින්දු අළුත් අවුරුද්ද වතු ආශ්‍රිත ජනතාව ද ඉහලින් සමරන බැවින් ඒ සඳහා දින 5-10 අතර ප්‍රමාණයක් කිරි කැපීම නියම ආකාරයෙන් සිදු නොවේ.

අප දැනට වසර 35-40 පමණ පෙරදී කිරි කැපීමේ පැවති ක්‍රමවේදය ගැන සලකා බැලුවහොත්, අනිවාර්යයෙන් රබර් ගස්වල කොළ හැලීම ආරම්භ වූ වහාම කිරි කැපීම නවත්වන අතර, නැවත කිරි කැපීම ආරම්භ කෙරෙනුයේ හොඳින් දළු මේරූ පසුවයි. එනම්, බොහෝ විට සිංහල අවුරුදු කාලයට පසුවයි. එවකට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිර්දේශය වුයේද එයයි.

එවකට බහුලව වගාකෙරුනු PB 86 සහ NAB 12 වැනි ක්ලෝන වලින් එක් කැපුමකදී එක් ගසකින් ලැබුන කිරි ප්‍රමාණයට සාපේක්ෂව අඩු අගයක් වූ අතර, පෙබරවාරි සිට අප්‍රේල් මැයි දක්වාම කිරි කැපූවිට ලැබෙන අස්වැන්න ජනවාරි මාසයේ ලැබෙන අස්වැන්න හා සසඳා බැලීමේදී ඉන් 1/3 හෝ සමහර ඉතා වියළි කාළගුණික තත්‍ව යටතේ ඊටත් වඩා අඩු වේ.බොහෝ විට කොළ හැලී දළු මෝරන තුරු පවතින මාස 2 හෝ 3ක කාලය කිරි කැපීම නවතා දැමීමට මෙය හේතුවන්නට ඇත. එහෙත් අස්වැන්න බොහෝ වැඩි RRIC 100, RRIC 121 වැනි ප්‍රභේද 1955-1965 වකවානුවේදී රබර් වගාව සඳහා නිර්දේශ කෙරුන අතර, කොළ හැලෙන කාලය තුල අස්වැන්න අඩු උවද, එය සෑහෙන අස්වැන්නක් නිසා කොළ නිවාඩුවේද කිරි කැපීම දිගටම සිදු කිරීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයෙන් 1970 දී පමණ නිර්දේශ කර ඇති බව පෙනේ. තවද, 1970 දී රබර් ගසේ කොළ හැලීමේදී, ඊට පෙර කොළ තුල ඇති පෝෂක කොටස් අතු වලට අවශෝෂනය කර ගැනීමක් සිදුවීමද මෙයට හේතුපාදක වන්නට ඇත. එමෙන්ම 80 දශකයේදී මෙන් නොව, රබර් අස්වැන්න නෙලා ගැනීම සඳහා පුහුණු කිරි කැපුම් කරුවන් සොයා ගැනීමද වසරින් වසර දුෂ්කර වූ අතර, මාස 2ක් හෝ 3ක් රැකියාව නැතිව ගිය විට නැවත ඔවුන්ව ගෙන්වා ගැනීමද අපහසු කරුණකි.කෙසේ උවද, කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නම්, මෙම වකවානුවේදී, කිරි කට්ටිය පාළු වන දින බොහෝය.ඉඩම් සිංහල අවුරුද්දට පළමුව කුඹුරු වපුරා අවසන් කලයුතු බව එදා පැවති විශ්වාසයයි. කුඹුරු ගෙවිතැන් සඳහා ප්‍රමුඛස්ථානය දීම දැන් පවා සිදුවේ.

කෙසේ උවද, එලදාව වැඩි නව ක්ලෝන සහිත වගාවන්හි පවතින පොත්ත වියළීමට පාත්‍ර වන ගස් සංඛ්‍යාව දිනෙන් දින වැඩිවීමක් දක්නට ඇති නිසාවෙන්ම කොළ නිවාඩුව තුලදී කිරි කැපීම, පෙර පරිදි නවතා තැබීමෙන් කුමන ආකාරයේ ප්‍රතිඵලයක් ලැබේද යන්න දැනට බහුලව වගා කෙරෙන RRIC 100, RRIC 121 හා දැනට වගාව සඳහා වැඩිපුරම යොදා ගැනෙන RRISL 203 ක්ලෝනය භාවිතා කර පරීක්ෂා කර බලන ලදි. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයට අයත් කුරුවිට වතුයායේ මෙම පරීක්ෂණය සිදු කළ අතර, ලද ප්‍රතිඵල සතුටුදායක මෙන්ම ධනාත්මක විය.

එනම්, කොළ නිවාඩුව කාලය තුලදී කිරි කැපීමනවතා තිබූ ගස්වල වසරේ ඉතිරි කාලයේදී එක් කැපුමකදී ලැබෙන කිරි ප්‍රමාණය සෑම දිනකම වැඩි අගයක් විය. මේ ප්‍රතිඵලය ආර්ථික විශ්ලේෂණයකටද භාජනයකල අතර, ඒ මගින් සනාථ වූයේ එම මාස 2 හෝ 3 කිරි නොකපා සිටීම ආර්ථිකව වාසිදායක බවයි.

රබර් ගසේ කිරි කැපීම ගසට කෘතිම පීඩනයක් (stress) ලබා දීමකි. රබර් ගස්වල පොත්ත වියළී යාමට හේතු පාදක වන කරුණු සොයා බැලීමේදී කිරි කැපීමෙන් ඇතිවන තත්‍වය විශේෂයෙන්ම නිර්දේශිත ක්‍රම අභිබවා කිරි කැපීම ප්‍රධාන තැනක් ගනී. කොළ නිවාඩුව සාමාන්‍යයෙන් වැහි රහිත කාලයයි. නැවත වර්ෂාව ආරම්භ වනුයේ අප්‍රේල් මැදට පසුවයි. එනම්, කාලගුණය අතින්ද ගස පීඩනයකට පත්ව පවතින කාලවකවානුවයි. කොළ හැළුනු පසු ගසේ මල් පිපෙන කාලය ආරම්භ වන අතර, පසුව නැවත දළු ලන පත්‍ර මෝරා වැඩීමට ගසෙහි විශාල පෝෂක කොටස් ප්‍රමාණයක් වැය කිරීමට සිදුවේ. මෙම වකවානුවේ අස්වැන්න අඩුවීමට එක් හේතුවක් ලෙස දක්වන්නේද මෙයයි.

මේ කරුණු සියල්ල සලකා බලන කල 2020 වසර රබර් වගාවන් සඳහා නම් ආශිර්වාදාත්මක වසරකි. දැනට පවතින අළුත් හා පරණ මෙන්ම සියලුම ක්ලෝන වලද පොත්ත වියළීමේ ප්‍රවනතාවය වැඩිවෙමින් පවතින මෙවැනි වකවානුවක කොවිඩ් 19 නිසා හෝ ඇඳිරි නීතිය නිසා හෝ කිරි නොකපා සිටීමෙන් අස්වැන්නේ හෝ ආදායමේ අඩුවක් සිදු නොවනු ඇත.

රබර් වතුවල කිරි කැපුම් කරුවන් පිළිබඳව සලකා බලන කල කොවිඩ් වසංගතයන් තුල සම්පූර්ණයෙන්ම සුරක්ෂිත රැකියාව ඔවුන්ට ලැබී ඇත. එනම්, රබර් වගාව තුල තනිවම සිටින බැවින් පුද්ගල දුරස්ථ භාවය උපරිමව පවත්වා ගත හැකිවේ. තවද, එක් එක් රැකියාවන්ගේ වැඩ කරන පරිසරය සලකා බැලීමේදී, ස්වභාවික පරිසරයක වැඩ කිරීමට ලැබීමද, වායු දූෂණයෙන් තොර පරිසරයක් වීමද භාග්‍යයකි.

එහෙත් රබර් වගා කරුවන් සැමදා මැසිවිලි නගන ප්‍රධාන අභියෝග දෙකක් ඇත. එනම්, රබර් මිළ පහත් අගයක පැවතීම සහ රබර් ඵලදායිතාවය අඩු වීමයි. ඇත්ත වශයෙන්ම බලන කළ මෙම ගැටළු දෙකම එකම කාසියක දෙපැත්ත වැනිය.

එහෙත් මෙම ගැටළු දෙක අතර ප්‍රධාන වෙනස් කමක්ද ඇත. එනම්, රබර් මිළ අපට පාලනය කල හැකි හෝ නිරීක්ෂණය කළ හැකි දෙයක් නොවීමත්, ඵලදායිතාවය සම්පූර්ණයෙන්ම අප විසින් පාලනය කල හැකි සහ කරගත යුතු දෙයක් වීමත් යන්නයි. ඵලදයිතාවය වැඩි කර ගැනීමට කටයුතු කළ විට දැනට පවතින, අඩු යයි සම්මත රබර් මිළ යටතේ උවද ඉතා හොඳ ලාබයක් ලබා ගත හැකි බව අපට ඉතා හොඳින් පැහැදිලි වේ. දැනට වැඩි වශයෙන් වගා කර ඇති RRIC 100, RRIC 121, RRIC 102, RRISL 203 සහ RRISL 2001 ක්ලෝන වල ඵලදා විභවය වසරකට හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 2500 පමණ අගයකි. එහෙත් දැනට ලංකාවේ ඵලදායිතාවයේ සාමාන්‍ය අගය වසරකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ.900ක් පමණ වේ. මෙය ඉතා අඩු අගයක් පමණක් නොව මිළ පිළිබඳව මැසිවිලි කීමට සිදුවී ඇත්තේ මේ නිසාවෙනි. එනම්, 2500 කෙසේ උවත් දැනට ලබාගන්නා ඵලදාව දෙගුණයක් කර ගත හැකිනම්, එනම්, 1800 බවට හෝ පත්කර ගත හැකි නම් රබර් කර්මාන්තයේ ඇති සියලු දුෂ්කරතා බොහෝ දුරට විසඳෙනු ඇත. ශ්‍රී ලංකාවේ රබර් වගාවේ ඵලදායිතවය මෙතරම් පහත වැටීමට හේතු වී ඇති කරුණු අප විසින් බොහෝ කලක සිට හඳුනා ගෙන ඇත. ඒ සඳහා බලපා ඇති සාධකවල බලපෑම අනුව පෙලගැස්උවහොත්,

1. ඉඩමේ තිබිය යුතු නියමිත ගස් ප්‍රමාණය නොමැති වීම.
2. අපරිනත කාලය තුල නිර්දේශයන්ට අනුව පොහොර නොයෙදීම ආදිය නිසා තිබෙන ගස් නියමිත වර්ධන තත්‍වයට පත් නොවීම.
3. ප්‍රධාන වශයෙන්ම අස්වනු නෙලීමේ අක්‍රමිකතාවයන් නිසා, ගස් විඩාවට පත්වී “පට්ටය තැම්බීම” හෙවත් පොත්ත වියළී යාමේ තත්‍වයට පත්වීම.

මෙම කරුණු අතරින්, නියමිත ගස් ගණන නොමැති වීම නිවැරදි කරගත හැකි වන්නේ වගාවේ රබර් පැළ ස්ථාපනය කර පළමු වසර තුන ඇතුලතදී පමණි. තවද, ඒ සඳහා සුදුසු වර්ධන තත්වයේ පැළ තම වගාව තුල පවත්වා ගෙන තිබිය යුතුය. හෙක්ටයාරයක ඉඩමක් නම් පැළ සිටුවන පරතරයන් අනුව සිටුවිය හැකි ගස් ගණන 515-519 කි. එනම්, ප්‍රථමයෙන්ම ඉඩමේ වපසරිය නිවැරදිව දැනගැනීම ඉතා වැදගත්ය. ඉඩම් සඳහා පැළ නිකුත් කිරීමේදී, ඉඩමේ සිටුවිය යුතු ගස් ප්‍රමාණය ගණනය කර එයට වැඩිපුර පැළ 10%ක් ලබා දෙනුයේ මෙලෙසට මියයන හෝ දුර්වලව වැඩෙන ගස් තිබේනම් ඒවා වෙනුවට සිටුවීම සඳහායි.

නමුත් බොහෝ අවස්ථාවලදි සිදුවන්නේ එලෙසට පැළ ලබා නොදීම හෝ එලෙසට ලබා දෙන පැළ පරතර අඩු කර ඉඩමේ ස්ථිර ගස් ලෙසටම සිටුවා ගැනීමයි. මේ නිසා කිසි විටෙකත් නියමිත පරතරයන්ට, හොඳින් වැඩෙන ගස් නියමිත ප්‍රමාණයෙන් ලබාගත හැකි ඵලදාව නොලැබෙනු ඇත.

නියමිත ගස් ගණන පවත්වා ගැනීම සඳහා සිදු කරන ඉතා අසාර්ථකම ක්‍රමය නම්, වසරක් පාසා වගාවේ මිය යන පැළ සඳහා කොළ මාල 2-3 සහිත කුඩා පැළ නැවත නැවත නිකුත් කිරීමයි. මෙලෙසට පැළ නිකුත් කිරීම මොණරාගල හෝ අම්පාර ප්‍රදේශවල ක්‍රියාත්මක වූ රබර් වගා කිරීමේ ව්‍යාපෘති වලින් දිගින් දිගටම සිදුකර ඒවායේ අසාර්ථක බව හොඳින් පෙන්වා දී ඇත. කෙසේ උවද නිර්දේශිත ක්‍රම අනුගමනය කර මෙම තත්වය නිවැරදි කරගත යුතුව ඇත. දැනට පවතින වසර 2-3ක් වූ වගාවන් පවතී නම් ඒවායේ නිවැරදි ගස් ගණන පවත්වා ගැනීමට වහාම පියවර ගත යුතුයි. තමා සතු පෞද්ගලික ඉඩමක රබර් සිටුවා ගත්තද, එයින් නිසි ආදායමක් තමාටත්, නියමිත රබර් ප්‍රමාණය රටටත් ලබාදීය හැකි ලෙස වගාව ස්ථාපනය කිරීම අපගේ වගකීම වේ. එසේ නොවන වගාවෙන් තමාට හෝ රටට කිසිඳු ප්‍රයෝජනයක් නොලැබෙනු ඇත.

ඊළඟ වැදගත් කරුණ නම්, පවතින ගස්වල වර්ධනයේ දුර්වලතාවයයි.ඕනෑම ක්ලෝනයකට අයත් ගසක් උවද, නියමිත වර්ධන තත්වයට එනම්, වසර 5-6 ගතවන විට පොළව මට්ටමේ සිට සෙ.මී. 120ක් හෝ අඩි 4ක උසකින් වටප්‍රමාණය සෙ.මී. 50ට ලඟාවී නොමැති නම් එම වගාව දුර්වල වගාවකි. මෙලෙසට දුර්වල ගස් ඇතිවීමට හේතු බොහෝ දැක්විය හැකි උවද, ප්‍රධානතම හේතුව ලෙසට සැලකිය හැකි වන්නේ, අපරිනත අවධියේදි පොහොර නියම මාත්‍රාවට ලබා නොදීමයි.

පැළවල දුර්වලතාවයන්ද මේ සඳහා දායක විය හැකි අතර, 2002 වසරේ පටන් ශ්‍රී ලංකාවේ නිපදවන රබර් පැළ ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් පමණ නිපදවනු ලබන්නේ රජයේ තවාන් වලින් වන අතර, ඒවායේ ගුණාත්මක බව පිළිබඳව වගකීමක් සහිත වේ.

ඵලදායිතාවය සඳහා බලපා ඇති අවාසනාවන්තම සාධකය වී ඇත්තේ අස්වැන්න නෙලීමේදී සිදුවන නිර්දේශයෙන් පරිබාහිර ක්‍රම නිසා, පට්ට තැම්බීමේ හෙවත් පොත්ත වියළී කිරි නැතිවී යාමේ තත්වයට පත්වීමයි. මෙලෙසට පොත්ත වියළීමට පටන් ගන්නා අවස්ථාවේදීම හඳුනා ගත හැකි උවහොත්, එනම්, කැපුම් කට්ටයේ කොටසක් පමණක් කිරි නොදෙන තත්වයට පත්වන විටම කිරි කැපීම නවතා මාස 6ක පමණ කාලයක් ගසට විවේකයක් ලබා දීමෙන් සමහර විට ගස් යථා තත්වයට පත්වේ. එහෙත් වියළීමේ ලක්ෂණ පෙන්වූ පසුවත් දිගින් දිගටම කිරි කැපීම සිදු කලහොත් බොහෝ විට ගස් ස්ථිරවම වියළී තත්වයට පත් වී යනු ඇත.එහෙයින් කිරි කැපීමේ කාර්යය හොඳින් දැනගෙන එනම්, නිර්දේශවලට අනුකූලවම සිදු කිරීමෙන් ස්ථිරසාර හොඳ ඵලදාවක් ගසේ ආයුකාලය පුරාවටම ලබා දෙනු ඇත.

රබර් වගාවන්හි කිරි කැපීම නවතා දැමීමට සිදුවූයේ මාසයකටත් වඩා අඩු කාලයක් වූ අතර, ඉහතදී සාකච්ඡා කල පරිදි, එම කාලයේදී අහිමි වූ කිරි ප්‍රමාණය අනිවාර්යයෙන්ම ඉදිරි මාසවලදී ලබා දෙනු ඇත.

එහෙත් බොහෝ කුඩා ඉඩම් හිමියන් මුහුණ පෑ සත්‍ය ගැටළුවනම් ඊට නැවත සාමාන්‍ය තත්වයට පත් උවද රබර් විකුණා ගත නොහැකි වීමයි. එයට ප්‍රධාන හේතුව කර්මාන්ත පෙර පරිදි ආරම්භ නොවීම ලෙස බොහෝ දෙනා අර්ථ දක්වයි. 2019 වසරේ මෙරටට ගෙන්වා ඇති රබර් ප්‍රමාණය ලංකාවේ එම වසරේ

සමස්ථ රබර් නිෂ්පාදනයට සමාන වන ප්‍රමාණයකි. එසේ නම්, ශ්‍රී ලංකාව තුළ රබර් නිෂ්පාදන අතිරික්තයක් නොමැත. මෙය නිෂ්පාදන හා පරිභෝගිකයා නිසි පරිදි මුණනොගැසීම ලෙස අර්ථ කථනය කළ යුතුද? රබර් වගාව සඳහා වගකියන ප්‍රධාන රාජ්‍ය ආයතන වන ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හා තුරු සවිය අරමුදල වැනි සියලු රාජ්‍ය ආයතන හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මෙම ගැටළුවට ස්ථිර විසඳුමක් ලබා දීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටුකරමින් සිටී. කෙසේ උවද රබර් වගාව මුළු ලෝකයේම, කුඩා රබර් ඉඩම්හිමියන් ගේ වගාවක් බවට පත්ව ඇති අතර, ලෝක රබර් නිශ්පාදනයෙන් 90% කට වඩා නිපදවනු ලබන්නේ කුඩා රබර් ඉඩම් විසින් බව දත්ත මගින් තහවුරු වී ඇත. ශ්‍රී ලංකාවේ වගා බිම් ප්‍රමාණයෙන් 64% කුඩා රබර් හිමියන් සතු වන අතර එම වගාවන් තමන්ටත් රටටත් යහපත් වන ලෙසට පවත්වා ගැනීම යුතුකමක් මෙන්ම වගකීමක්ද වේ.